**ගිරිබාව ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 ජූනි 06 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 30 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ගිරිබාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු ඉඩම් 32 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) වන්නිකුඩාවැව සායන මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ හා පෙර පාසැල් ගොඩනැගිල්ලේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සභාව විසින් රු.2,380,356 ක් වැයකර ඉදිකර තිබුණු වාහන නවතා තැබීමේ ගරාජයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී රු.15,913,882 ක් වැයකර ඉදිකර තිබුණු තඹුත්ත මහජන පුස්තකාල ගොඩනැගිල්ල හා පැරකුම්පුර සතිපොල ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමේ වියදම ගිණුම්ගත කර නොතිබුණි.

### 1.3.2 නොසැසඳුණු ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 11 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ හා උපලේඛන/උපයෝගී ලේඛන අනුව ශේෂ අතර රු.44,708,570 ක වෙනස්කම් පැවතුණි.

**1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**
**--------------------------------**

(අ) ලැබියයුතු ගිණුම්
--------------------
පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2017 දෙසැම්බර් 31 දිනට රු.39,433,371 ක් වූ ලැබියයුතු ගිණුම් වලින් රු.33,496,765 කට අදාලව කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණ අතර වර්ෂ 03 ක් ඉක්මවා තිබුණු හිඟහිටි බදු කුලී රු. 228,834 ක් අයකර ගෙන නොතිබුණි.

(ii) දීර්ඝ කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සභාවට අයත් රු.101,500 ක තැන්පතු ශේෂ 05 ක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගෙවියයුතු ගිණුම්
---------------------
2017 දෙසැම්බර් 31 දිනට රු.34,697,495 ක් වූ ගෙවියයුතු ගිණුම් ශේෂ වලින් රු.18,726,908 කට අදාලව කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**
**--------------------------------------------------------**
අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.42,366,464 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

**---------------------------------------------------------------------------**
2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව සභාව සතු රු.1,301,180 ක් වූ පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි.

**1.3.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු**
**-------------------------------------------------------------**

වටිනාකම රු.9,073,339 ක් වූ ණයහිමි ශේෂ 38 ක් හා වටිනාකම රු.8,657,335 ක් වූ ණයගැති ශේෂ 01 ක් විධිමත් අනුමැතියකින් තොරව ගිණුම්වලින් ඉවත් කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.259,140 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.86,050 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017වර්ෂය | | | | 2016 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 385 | 391 | 391 | 35 | 5 | 390 | 390 | 360 |
| (ii) | බදු කුලී | 2,939 | 3,520 | 2,258 | 372 | 2,921 | 3,020 | 2,563 | 325 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 410 | 377 | 497 | 46 | 680 | 375 | 375 | - |
| (iv) | වෙනත් ආදායම් | 36,199 | 27,750 | 27,892 | 5,450 | 34,190 | 27,795 | 30,790 | 1,806 |
| එකතුව | | 39,933 | 32,038 | 31,038 | 5,903 | 37,796 | 31,580 | 34,118 | 2,491 |

සටහන

- සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම් හා සභාව විසින් විගණනය වෙත ඉදිරිපත් කරන ලද වටිනාකම් අතර වෙනස්කම් පැවතුණි.
- සමාලෝචිත වර්ෂයේ රැස් කළ ආදායම තුළ පසුගිය වර්ෂ වල හිඟ ලැබීම් ද ඇතුළත්ව තිබුණි.

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

**-------------------------------------**

සමාලෝචිත වර්ෂයට බිල් කළ ආදායම රු.මි.32 කින් සහ ඉකුත් වර්ෂය අවසානයට හිඟ ආදායම් රු.මි. 2.4 කින් එකතුව රු.මි. 31 ක් අයකරගෙන තිබුණි. ඉකුත් වර්ෂයේ රු.මි.2.4 ක හිඟ ආදායම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.මි.5.9 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**2.2.3 කුලී**

**-----**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2002 වර්ෂයේ සිට හිඟව තිබුණු රු.80,056 ක බදු කුලිය අයකර ගැනීමට සභාව ගෙන තිබුණු නීතිමය ක්‍රියාමාර්ග අසාර්ථක වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාලව වත්කම් බදු දීමෙන් රු.55,500 ක හිඟ බදුකුලී අයකර ගත යුතුව තිබුණි.

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**-------------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබියයුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.2,867,000 ක් හා රු.488,928 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------**

**3.1 කාර්යසාධනය**

**------------------**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

------------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් එම අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

----------------------

සභාව විසින් වැළඳගෙන තිබුණු අතුරු ව්‍යවස්ථා අනුව ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ භූමිය වටා වැටක් ඉදිකර ගේට්ටුවක් සවිකිරීම සඳහා රු.456,157 ක් වැයකර වර්ෂ 03 ක් ගතව තිබුණද සභාව දෛනිකව කසළ එකතු නොකිරීම හේතුවෙන් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු ආරම්භ කළ නොහැකිව තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ දී කසළ වර්ගීකරණය සම්බන්ධ වැඩසටහන්, පාසැල් චිත්‍ර තරඟ, ගෙවතු වගා තරඟ හා කසළ බඳුන් බෙදා හැරීම වැනි වැඩසටහන් පැවැත්වීම සඳහා රු.171,040 ක් වැයකර තිබුණි.

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්වී නොතිබුණ අතර ඒ සම්බන්ධව ඉදිරි කටයුතු කිසිවක් ආරම්භ කර නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) බැහැර දී ආපසු ලැබී නොමැති රු.8,935 ක අස්ථානගතව තිබුණු රු.3,990 ක පුස්තකාල පොත්වල වටිනාකම වගකිය යුතු පාර්ශවවලින් අයකර ගෙන නොතිබුණි.

(ආ) සභා බලප්‍රදේශයේ නව සංවර්ධිත ප්‍රදේශ හඳුනාගෙන නියමිත පරිදි ගැසට් කර වරිපනම් බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට කාර්යය මණ්ඩල පුරප්පාඩු 09 ක් පැවතුණි.

(ආ) සේවයෙන් පහකරන ලද හා ස්ථාන මාරු වී ගොස් තිබුණු 03 දෙනෙකුගෙන් රු.33,888 ක් අයකර ගැනීමට තිබුණි.

### 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම

තේක්ක දැව කඳන් 25 – 30 ක පමණ ප්‍රමාණයක අගය තක්සේරු කර තොග පොත්වලට ගැනීම සිදු කර නොතිබුණි.

### 3.4.2 පවරා නොගත් වත්කම්

සභාවේ ප්‍රධාන කාර්යාලය, පුස්තකාලය, සායන මධ්‍යස්ථානය සහ ප්‍රජා ශාලා පවත්වාගෙන යන ඉඩම්, ක්‍රීඩාපිටි, සතිපොල, රථ ගාල් හා සුසාන භූමිවලට අයත් ඉඩම් සභාවට පවරා ගෙන නොතිබුණි.

### 3.4.3 නිශ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

(i) වටිනාකම රු.608,020 ක් වූ ට්‍රැක්ටරයක් 2012 වර්ෂයේ සිට ක්‍රියාවිරහිතව පැවතුණි.

(ii) වර්ෂ 03 කට පෙර රු.1,125,401 ක් වැයකර ආරම්භ කර තිබුණු කුට්ටිගල් නිෂ්පාදන ව්‍යාපෘතිය අක්‍රීයව පැවතුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 ජූනි 06 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 07 දිනද විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

### 4.2 අයවැය පාලනය

(අ) වැය විෂයයන් 06 කට අදාළව ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 සිට සියයට 42 දක්වා ඉතිරි වීම් හා ආදායම් විෂයයන් 03 ක සියයට 62 සිට සියයට 86 දක්වා ආදායම් රැස් කිරීමේ අඩුවීම්ද නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ අයවැය ගත නොකල ව්‍යාපෘති 07 ක් සඳහා රු.1,327,469 ක් වැය කර තිබුණි.

**5. පද්ධති හා පාලන**

**--------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
| --- | --- |
| ----------- | ------------- |
| (අ) ගිණුම්කරණය | ගිණුම් පොත්පත් හා ලේඛන යාවත්කාලීනව නොපැවැත්වීම. |
| (ආ) වත්කම්/දේපල පාලනය | (i) තොග ලේඛනගත නොකිරීම.<br>(ii) ආරක්ෂාව තහවුරු නොකිරීම. |
| (ඇ) තොග පාලනය | (i) තොග ලේඛනගත නොකිරීම.<br>(ii) අවිධිමත් තොග පාලනය. |
| (ඈ) ණයගැති/ණයහිමිපාලනය | (i) උපලේඛන පිළියෙල නොකිරීම.<br>(ii) කාල විශ්ලේෂණ පිළියෙල නොකිරීම. |
| (ඉ) සේවක කළමනාකරණය | පුරප්පාඩු සම්පූර්ණ කර නොගැනීම. |
| (ඊ) ව්‍යාපෘති/කොන්ත්‍රාත් පාලනය | (i) අයවැයගත කොන්ත්‍රාත් ඉටු නොකිරීම.<br>(ii) අයවැයගත නොවූ කොන්ත්‍රාත් ඉටු කිරීම.<br>(iii) ව්‍යාපෘති අතරමග නතර කිරීම. |